**මිනුවන්ගොඩ නගර සභාව - 2022**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මිනුවන්ගොඩ නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මිනුවන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 1.6.1 නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.2 යටතේ පරිගණක මෘදුකාංග, වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගන්නා බව දක්වා තිබුණ ද ආදායම් අංශයේ හා පුස්තකාලයේ භාවිතා කරන පරිගණක මෘදුකාංග දෙකක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | මෙම වටිනාකම් 2023.12.31 දිනෙන් අවසන් වර්ෂයේ අවසන් ගිණුමට ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | ගිණුම්ගත කිරීම් නිවැරදිව කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ අනුව ගිණුම් විෂයයන් 06 ක එකතුව හා උපයෝගී ලේඛන අනුව ශේෂයන්ගේ එකතුව අතර රු. 2,918,861ක වෙනසක් විය. | 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුමෙන් නිවැරදි කර ඉදිරිපත් කරන බව. | වෙනසට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| හිඟ වෙළඳපල කුලී | 314,925 | උපලේඛනය | 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුමෙන් නිවැරදි කර ඉදිරිපත් කරන බව. | උපලේඛනය නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු 58,160.ක මුද්දර බදු 2023 අප්‍රේල් 03 දින වන විටත් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවා නොතිබුණි. | මුද්දර බදු ශේෂය ප්‍රේෂණය කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු මුද්දර බදු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.26,655,396 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.22,083,743 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.72,885,587 ක් ආයෝජනය කිරීමකින් තොරව ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. | බස්නැවතුම්පොළ අසළ ඇති නව පොදු වෙළඳ සංකීර්ණයේ ස්වයංක්‍රීය දොරවල් සවිකිරීමට ඇස්තමේන්තු සකසා අනුමැතිය මේ වන විට ලැබී ඇති අතර ඒ සඳහා කඩිනමින් ගෙවීම් කිරීමට අවශ්‍ය වන බැවින් ජංගම ගිණුමේ මුදල් රඳවාගෙන ඇති බව. | අතිරික්ත මුදල් ජංගම ගිණුමේ රඳවා නොගෙන ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 20,515 | 20,474 | 14,319 | 14,577 | 20,250 | 21,433 | 14,193 | 15,673 |
| (ii) කුලී | 40,675 | 29,640 | 27,326 | 2,370 | 14,497 | 16,340 | 14,984 | 1,189 |
| (iii)බලපත්‍ර ගාස්තු | 846 | 723 | 686 | 37 | 400 | 298 | 243 | 55 |
| (iv)වෙනත් ආදායම් | 24,925 | 31,957 | 31,957 | - | 47,090 | 33,693 | 33,693 | - |
| | 86,961 | 82,794 | 74,288 | 16,984 | 82,237 | 71,764 | 63,113 | 16,917 |

2.3.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයට අදාල වරිපනම් හා බදු බිල්කළ ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.950,000කින් අඩුවී තිබුණි. | කොට්ඨාස වශයෙන් වෙන් කර හිඟ ආදායම් අය කිරීමේ සැලැස්මක් සකස් කර ආදායම් අය කිරීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| **කුලී**<br>----- | | |
| හිඟ ආදායම් අයකර ගැනීමේ උපලේඛනය අනුව 2022 දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී රු 1,571,919.ක් විය. | 2023.04.30 දින වන විට වෙළඳ ස්ථාන හිඟයෙන් සියයට 65 ක් අය කර ඇති බව. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුද්ගලික සමාගමක් වෙත 2021 වර්ෂයේ ගෙවා තිබූ රු. 1,004,400ක අත්තිකාරම් මුදල 2023 මාර්තු 31 විගණිත දින වන විටත් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විදුලි සෝපානය සපයා සවිකිරීම වෙනුවෙන් ලබා දුන් අත්තිකාරම් මුදල්, අවසන් ගෙවීම් සිදු කිරීමේදී අඩු කරන තුරු අත්තිකාරම් ලෙස සටහන් කර ඇති බව. | 2021 ජූලි මස ගෙවා තිබූ අත්තිකාරම් මුදල පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

3.2 **වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාව විසින් 1979 වර්ෂයේ සිට මහජන ක්‍රීඩාංගණයක් ලෙස සංවර්ධනය කර නඩත්තු කර තිබුණු අක්කර 08 ක භූමි ප්‍රමාණයක් සහිත ජාපාලවත්ත ක්‍රීඩා පිටිය, ඉඩම් හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉඩම් අත්පත් කර ගැනීම් පනතේ ප්‍රතිපාදන අනුව රජය සතු කර ගන්නා තෙක් සංවර්ධන කටයුතු සඳහා නිරවුල් භුක්තිය මිනුවන්ගොඩ ජනාධිපති විද්‍යාලය වෙත සභාවේ විරෝධතාවය නොසලකා පවරා තිබුණි. | ක්‍රීඩා පිටියේ අයිතිය මිනුවන්ගොඩ නගර සභාවට ලබා දෙන බවට ගරු බ.ප.ආණ්ඩුකාරතුමන් විසින් වාචිකව ප්‍රකාශ කර ඇති බව. | භූමියේ නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නව පුස්තකාල ගොඩනැගිල්ල සඳහා රු. 5,860,938ක උපකරණ මිලදීගැනීමට අදාලව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 7.9.10හා 7.11.1ප්‍රකාරව නගර සභාව සකස් කරන ලද පිරිවිතර හා ආයතන එවන ලද පිරිවිතර සැසඳීම සඳහා සැසඳීම් වාර්තා පිළියෙල කර නොතිබුණි. | විමසුම පිළිගන්නා බව. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 මැයි 11 දින සිට ආදාහනාගාරයේ බර්නර් 2ක් අක්‍රිය වී වසරකට වැඩි කාලයක පමණ සිට අලුත්වැඩියාවකින් තොරව මෘතශරීර පිලිස්සීම් කටයුතු සිදු කරන බැවින් විෂ දුම නැවත දහනයකින් තොරව පරිසරයට මුදා හැරීම නිසා පරිසර දූෂණය වැලැක්විය නොහැකි විය. | මෙම අළුත්වැඩියා කටයුතු සිදු කිරීම ප්‍රමාද වී ඇත. එසේ වුවද ප්‍රදේශයේ කොරෝනා මළසිරුරු ආදාහනය කිරීමට නගර සභාවට සිදු වූ බව. | පරිසර දූෂණය වීම වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |